## ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය - 2014

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 2000 අංක 43 දරන ශ්‍රී ලංකා රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 8 (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැළසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1** **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2. 2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1** **ගිණුම්කරණ ප්‍රතිපත්ති**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

මණ්ඩලය ආදායම් හඳුනා ගැනීම උපචිත පදනම මත සිදු කළද සමාලෝචිත වර්ෂය අවසාන වන විට හඳුනාගෙන තිබූ ඉකුත් වර්ෂ 3 ට අදාල ජාතික රක්ෂණ භාර අරමුදලින් ලැබිය යුතු රු.5,897,549 ක් වූ වාර්ෂික ගාස්තු හා 2011 හා 2012 වර්ෂ වෙනුවෙන් වූ රු.32,249,024 ක සෙස් බදු ආදායම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. 2014 වර්ෂය සඳහා අරමුදලින් ලැබිය යුතු වාර්ෂික ගාස්තු හා 2013 හා 2014 වර්ෂ වෙනුවෙන් ලැබිය යුතු සෙස් බද්ද හඳුනාගෙන නොතිබුණු අතර ඒ වෙනුවෙන් ඇස්තමේන්තුගත මුදලක් හෝ ගිණුම්ගත කර නොතිබුණි.

**2.2.2** **ගිණුම්කරණ අඩුපාඩු**

විගණන ගාස්තු ගෙවීම වෙනුවෙන් බැරකමක් ඇති වී නොතිබියදී 2010 සිට 2012 වර්ෂය දක්වා ගෙවිය යුතු අභ්‍යන්තර විගණන ගාස්තු වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල සාවද්‍ය ලෙස රු.1,035,000 ක් දක්වා තිබුණි.

**2.3** **නීති ,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

විගණනයේදී පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| **නීති ,රීති, රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත | |
| (i) 79 හා 82 (1)ඡේද | තැරැව්කරුවකු වශයෙන් ලියාපදිංචි කිරීමේ සහතිකයක් නොමැතිව රක්ෂණ තැරැව්කරුවකුගේ ව්‍යාපාරය කරගෙන යාම තහනම් වන අතර එසේ ඉල්ලුම් කර ඇති විටක හා ඊට අදාල අවශ්‍යතාවයන් පිළිබඳ මණ්ඩලය සෑහීමකට පත්වන අවස්ථාවක මණ්ඩලය විසින් එම ඉල්ලුම්කරු, රක්ෂණ තැරැව්කරුවකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබිය යුතු වුවද, මණ්ඩලයේ සභාපතිවරයා විසින් මහජනයා වෙත කරන ලද දැන්වීමක් අනුව 2012 අප්‍රේල් 27 දින සිට නැවත දන්වන තුරු එවැනි ලියාපදිංචි සඳහා අයදුම්පත් භාර ගැනීම නවතා දමා තිබුණි. කෙසේ වුවද මේ සම්බන්ධයෙන් මණ්ඩලයේ සභාපති විසින් විගණනයට දන්වා තිබුණේ පනතේ 5 (ඌ) වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ අරමුණු හා වගකීම් සපුරාලීමේදී අවශ්‍යවන වෙනත් ඕනෑම ක්‍රියාවක් කිරීමට හැකි බලය |

මණ්ඩලය සතු බවයි.

(i) 103 (1) වගන්තිය — රක්ෂණ ඔප්පු දරන්නන්ගේ ආරක්ෂක අරමුදලක් පිහිටුවා ඒ සඳහා පනතේ 7 වන වගන්තිය යටතේ පනවා අය කරනු ලබන සෙස් බද්දෙන් උපචිත වන මුදල් බැර කරනු ලැබිය යුතු වූ අතර පනත ප්‍රකාරව, එම අරමුදලේ මුදල් යෙදවිය යුතු කාර්යයන්වලට පටහැනිව මණ්ඩලයේ මුළු වියදම් පියවීමට ප්‍රමාණවත් තරම් ආදායම් උපයා නොමැති සෑම අවස්ථාවකදීම මණ්ඩලයේ ඌනතාවය පියවීමට එම අරමුදල උපයෝගී කරගෙන තිබුණි. ඊට අමතරව, 2013 වර්ෂයේදී රු. 300,000,000 ක් මෙම අරමුදලින් ඒකාබද්ධ අරමුදලටද මාරු කර තිබුණි.

(ආ) 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

(i) 6.5.1 ඡේදය — සමාලෝචිත වර්ෂයට අදාල මණ්ඩලයේ වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් මූල්‍ය ප්‍රකාශන සමඟ විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 8.3.4 ඡේදය — දුරකථන ගාස්තු අනුමත සීමා ඉක්මවා තිබේදැයි තහවුරු කර ගැනීමේදී එක් එක් නිලධාරියාගේ කාර්යාල හා නිවාස දුරකථන සඳහා ගෙවනු ලබන ඇමතුම් ගාස්තු සියල්ලේ එකතුව ලබාගත යුතු වුවද, නිලධාරීන් 6 දෙනෙකු සඳහා වෙන් කර තිබූ රාජකාරි දුරකථන භාවිතා නොකොට පොදු දුරකථන හරහා ඇමතුම් ලබා ගැනීම හේතුවෙන් පොදු දුරකථන වියදම රු.1,633,011 ක් ලෙස ඉහළ අගයක් ගෙන තිබුණි.

(iii) 9.14.1 ඡේදය — පරිපාලන අත්පොත සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙතින් අනුමැතිය ලබාගෙන නොතිබුණි .

## 2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් විධිමත් අනුමැතියකින් තොරව නිලධාරීන් 82 දෙනෙකුට රු. 50,000 ක් බැගින් උත්සව අත්තිකාරම් ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් එකතුව රු.1,065,000 ක ශේෂයක් පැවතියද, ආයතන සංග්‍රහයට සිදු කළ සංශෝධන අනුව උත්සව අත්තිකාරම් ලෙස ලබාදිය හැකි උපරිම මුදල රු.5,000 කට පමණක් සීමා වී තිබුණි.

(ආ) විධිමත් අනුමැතියකින් තොරව මූලික වැටුප රු. 25,000 ට අඩු නිලධාරීන් 5 දෙනෙකු සඳහා ආපදා ණය ලෙස රු.250,000 ක් බැගින් ගෙවා තිබුණි.

(ඇ) 1994 ජූනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව අමාත්‍ය මණ්ඩලය, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හෝ භාණ්ඩාගාරය විසින් නිශ්චිතවම අනුමත කරන ලද ප්‍රතිලාභ පමණක් තම පාලක මණ්ඩලවල අනුමැතිය ඇතිව සිය සේවකයින්ට ගෙවීමට සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවලට හැකි බවත් එවැනි අධිකාර බලයක් නොමැතිව සිදු කරන අතිරේක දීමනා, දිරි දීමනා ගෙවීම් සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගත යුතු බවත් දක්වා තිබුණද, භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ 2009 දෙසැම්බර් 29 දිනැති අංක

MF/2/4/IBSL/GEN දරන ලිපිය මඟින් දන්වා තිබුණු පරිදි මණ්ඩලය විසින් දිරිදීමනා යෝජනා ක්‍රමයක් සකස් කර ඒ සඳහා අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. කෙසේ වුවද මණ්ඩලය 2009 සිට 2012 දක්වා ප්‍රසාද දීමනාද 2013 හා 2014 වර්ෂවල දිරිදීමනා ලෙස පිළිවෙලින් රු.1,951,246 ක් හා රු.1,754,948 ක් ගෙවා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.163,129 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.148,207 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.14,922 ක හෙවත් සියයට 10 ක වැඩිවීමක් දක්නට ලැබුණි. මේ සඳහා වියදම රු.2,082,777 කින් වැඩිවීමට සාපේක්ෂව ආදායම රු. 2,097,699 කින් වැඩිවීම බලපා තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට වූ ජංගම වත්කම්වල වටිනාකම රු.2,195,085,644 ක් වූ අතර එයින් සියයට 99 ක් හෙවත් රු.2,170,032,222 ක් 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 103 වන වගන්තිය ප්‍රකාරව පිහිට වූ රක්ෂණ ඔප්පු දරන්නන්ගේ ආරක්ෂණ අරමුදලෙහි ආයෝජනයන් නියෝජනය විය. ඒ අනුව ජංගම වත්කම් අනුපාතය 105:1 ලෙස ඉහල මට්ටමක පැවතුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රක්ෂණ සහතික දරන්නන්ගේ සහ අනාගත රක්ෂණ සහතික දරන්නන්ගේ සම්බන්ධතා ආරක්ෂා කිරීම අරමුණු කර ගනිමින් රක්ෂිතයෙකු විසින් ඉදිරිපත් කරනු ලබන රක්ෂණ හිමිකම් ගෙවීමක් සම්බන්ධ ආරවුලකදී එය විමර්ශනය කිරීමේ ව්‍යවස්ථාපිත බලතල මණ්ඩලය සතු වූ අතර සමාලෝචිත වර්ෂය තුළ මෙසේ මණ්ඩලය වෙත ලද පැමිණිලි සංඛ්‍යාව 284 කි. ඉන් පැමිණිලි 157 ක් සහ 2013 වර්ෂයේ සිදු කරන ලද පැමිණිලි 11 ක් සම්බන්ධයෙන් විගණිත දිනය වූ 2015 අප්‍රේල් 07 දින වන විටත් විමර්ශන කටයුතු අවසන් කර නොතිබුණු අතරම විමර්ශනය අවසන් කිරීමට මාස 03 සිට මාස 10 දක්වා ප්‍රමාද වූ අවස්ථා 75 ක් විය.

(ආ) රක්ෂණ ඔප්පු හිමියන් ආරක්ෂා කිරීමේ හා මහජනතාව දැනුවත් කිරීම තුලින් රක්ෂණය පිළිබඳව විශ්වාසය වර්ධනය කිරීමේ අරමුණින් වෙළඳ පොළ සංවර්ධන හා බාහිර සම්බන්ධතා ඒකකය පිහිටුවා තිබුණු අතර මෙම ඒකකය මඟින් සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ කාර්යයන් සඳහා රු.10,100,000 ක් ප්‍රතිපාදනය කර තිබුණි. එම කාර්යයන්වල ප්‍රගතිය පහත පරිදි විය.

(i) රාජ්‍ය නියෝජිතයින්ගේ රක්ෂණය පිළිබඳ දැනුම වර්ධනය කිරීමේ අරමුණින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල දැනුවත් කිරීමේ වැඩසටහන් 10 ක් පවත්වා තිබුණද, ඉන් කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පවත්වන ලද වැඩසටහන සඳහා සහභාගී වී තිබුණේ පුද්ගලයින් දහතුන් දෙනෙකු පමණක් විය.

(ii) සමාලෝචිත වර්ෂය තුල තෝරාගත් මහජනයා රැස්වන ස්ථාන සඳහා ඉදිරිපත් කිරීම් 3 ක් පැවැත්වීමට සැලැසුම් කර තිබුණද එම කාර්යය නිම කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(iii) ප්‍රදර්ශන සඳහා සහභාගිවීම සහ ප්‍රධාන මාර්ගවල සිදු කරනු ලබන වීදි ප්‍රචාරණ කටයුතු සඳහා සහභාගිවීමට සැලැසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුලදී දැයට කිරුල ප්‍රදර්ශනය සඳහා පමණක් මණ්ඩලය සහභාගි වී තිබුණි.

(iv) විද්‍යුත් මාධ්‍ය වැඩසටහන් යටතේ රු.2,500,000 ක ඇස්තමේන්තුවක් මත ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබු ලේඛනගත මාධ්‍ය ව්‍යාපාරය වර්ෂය තුළ ක්‍රියාත්මක කළ බවට සාක්ෂි ඉදිරිපත් නොවුණි.

(v) රක්ෂණ කර්මාන්තයේ හා ඔප්පු හිමියන්ගේ යහපත උදෙසා රක්ෂණ ඔප්පු වැඩි දියුණු කිරීමේ අදහසින් සමාගම්වල රක්ෂණ නිපැයුම් සමාලෝචනයට ලක් කිරීම යටතේ සමාලෝචිත වර්ෂය තුල රක්ෂණ සමාගම් 6 ක් විසින් හඳුන්වා දී ඇති රක්ෂණ ඔප්පු 7 ක් සමාලෝචනයට භාජනය කර තිබුණි. ඊට අදාලව රක්ෂණ ඔප්පුවල පවතින දුර්වලතා සහ ඒ සඳහා යෝජිත නිර්දේශ ඇතුලත් වාර්තාවක් පිළියෙල කර මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත 2014 නොවැම්බර් 19 දින ඉදිරිපත් කර තිබුණද එම වාර්තාවෙන් පෙන්වා දී ඇති අඩුපාඩු පිළිබඳව අදාල රක්ෂණ සමාගම් දැනුවත් කිරීමට විගණිත දිනය වු 2015 අප්‍රේල් 08 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) 2009 වර්ෂයේදී මණ්ඩලය විසින් පෞද්ගලික රක්ෂණ ආයතනයක් වෙත අත්හිටුවීමක් පනවා තිබුණු අතර අංක SC(FR)191/09 දරන මූලික අයිතිවාසිකම් නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය ලබාදුන් නියෝග ප්‍රකාර, එම සමාගම වෙත ඉදිරිපත් කරනු ලබන අව්‍යාජ රක්ෂණ හිමිකම් පෑම් ක්‍රමවත්ව බේරුම් කිරීම සඳහා එකී සමාගමේ වත්කම් බැහැර කිරීම සඳහා මණ්ඩලය, සමාගම සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹී තිබුණි. ඒ අනුව, හිමිකම් ඉල්ලුම්කරුවන්ට ඔවුන්ගේ හිමිකම් ඉල්ලීම් මණ්ඩලය වෙත ලිඛිතව ඉදිරිපත් කරන ලෙසට පුවත්පත් නිවේදනයක් මඟින් දැනුම් දී තිබුණු අතර එසේ ලද අව්‍යාජ හිමිකම් පෑම් 142 කින් කිසිදු හිමිකම් ඉල්ලීමක් සඳහා ගෙවීම් කර අවසන් කර නොතිබුණි.

**4.2 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත තනතුරු සංඛ්‍යාව 43 ක් වුවද, තථ්‍ය සංඛ්‍යාව 41 ක් වීමෙන් පුරප්පාඩු 03 ක් හා අතිරික්ත 01 ක් පැවතුණි. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති තනතුරු සංඛ්‍යාව ඉක්මවා කාර්යාල සහායක තනතුරක් සඳහා බඳවා ගැනීම් සිදු කර තිබුණද, ඒ සඳහා ලබාගත් අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවීය .

(ආ) ස්ථිර තනතුරක් වන අධ්‍යක්ෂ සුපරීක්ෂණ තනතුර සඳහා 2011 දෙසැම්බර් 26 දින කොන්ත්‍රාත් පදනම මත අධ්‍යක්ෂවරයෙකු පත් කර තිබුණු අතර ස්ථිරව නිලධාරියෙකු බඳවා ගැනීමට මණ්ඩලය ක්‍රියා කර නොතිබුණි.

(ඇ) 2007 නොවැම්බර් 26 දින සිට පුරප්පාඩුව පවතින සහකාර අධ්‍යක්ෂ තනතුරු දෙක සඳහා සුදුසුකම් සහිත නිලධාරීන් බඳවා ගැනීමට විගණිත දිනය වු 2015 මැයි 20 දින දක්වාත් මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

(ඇ) එක් එක් තනතුරට අදාල බඳවා ගැනීම් පරිපාටි සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 4.3 ආර්ථික නොවූ ගනුදෙනු

මණ්ඩලය විසින් තම කාර්යාලය අවම පිරිවැයකින් පවත්වා ගැනීමට කටයුතු නොකොට ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ වර්ග අඩියකට රු.214 බැගින් අඩි 8,741 ක ප්‍රමාණයක් සඳහා සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.23,862,930 ක විශාල පිරිවැයක් හා රථ ගාල් කිරීමේ ගාස්තු ලෙස රු.383,160 ක් ගෙවා තිබුණි. ඒ හේතුවෙන් වාර්ෂිකව, ආදායම ඉක්මවූ වියදම පියවා ගැනීමට රක්ෂණ ඔප්පු දරන්නන්ගේ ආරක්ෂක අරමුදලින්ද මුදල් ලබා ගැනීමට මණ්ඩලය ක්‍රියා කර තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සියයට 3 සිට සියයට 100 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

### 5.2 නොවිසඳී ඇති විගණන ඡේද

2014 අප්‍රේල් 08 දින පැවති රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ ගිණුම් කාරක සභාව විසින් ලබාදුන් නියෝග ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2010 වර්ෂයේදී මණ්ඩලය විසින් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව එහි නිලධාරින් 17 දෙනෙකු වෙත වැටුප් වර්ධක දෙක බැගින් ගෙවා තිබීම හා 2012 ජුලි මාසයේ සිට මණ්ඩලය විසින් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව එහි සියලුම නිලධාරින්ගේ වැටුප් සියයට 25 කින් වැඩි කිරීම සම්බන්ධව වර්තමාන කළමනාකාරිත්වය භාණ්ඩාගාරය වෙත ලිඛිතව දැනුම් දී ඒ සම්බන්ධයෙන් ඔවුන්ගෙන් උපදෙස් ලබාගත යුතු බවට නියෝග කර තිබුණ ද, ඊට සම්බන්ධව තොරතුරු ඇතුළත් ලිපියක් මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර ඇති බව පමණක් විගණනයට දන්වා තිබුණි.

(ආ) භාණ්ඩාගාර අනුමැතියකින් තොරව රු.513,713 ක් වැය කරමින් මණ්ඩලයේ නිලධාරින් 33 දෙනෙකු හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සඳහා රක්ෂණාවරණයක් ලබා ගැනීම සම්බන්ධයෙන් විධිමත් පරිදි කටයුතු කරන ලෙස මණ්ඩලයට නියෝග කර තිබුණද, මේ සම්බන්ධයෙන් භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) කාර්ය මණ්ඩල පරිපාලනය
(ඇ) සේවක ණය පරිපාලනය